# ඇබෑර්තු - අභ්‍යන්තර විගණක තනතුර (කොන්ත්‍රාත් පදනම)

## දියුණු වෙමින් පවතින ප්‍රදේශ ඉලක්ක කොටගෙන මූලික සමාජ සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - JICA GOSL

**සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**385, පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ 10**

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජයිකා) ණය මුදල් මඟින් දියුණු වෙමින් පවතින ප්‍රදේශ ඉලක්ක කොටගෙන මූලික සමාජ සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

උක්ත ව්‍යාපෘතිය මඟින් ද්වීතියික මට්ටමේ රෝහල් වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීමට අපේක්ෂිතයි. ව්‍යාපෘති කාර්යාලයේ අභ්‍යන්තර විගණක තනතුර (කොන්ත්‍රාත් පදනම) සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය:**

ප්‍රමාණවත් ක්‍රම පද්ධති හා ක්‍රියා පටිපාටිය අධීක්ෂණය මඟින් අභ්‍යන්තර පාලනයන් තහවුරු කිරීම සහ සුපුරුදු, හුරුපුරුදු සහ නිත්‍ය විමර්ශනයක් සිදුකිරීම සහ ආයතනයේ සියලු කාර්ය කටයුතු පරීක්ෂා කිරීම පිළිබඳ වගකීම් භාරය දැරිය යුතුය.

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් කළමණාකරණය/ගණකාධිකරණය/රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීයවේදී ගණකාධිකරණ ආයතනයකින් ලබාගත් ආයතනික අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම

**සහ**

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් රාජ්‍ය අංශයේ/පෞද්ගලික අංශයේ තනතුරක අඩුම තරමින් වසර එකක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**වැටුප් පරිමාණය හා බඳවා ගැනීම:**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2016 හි විධිවිධානයන්ට අනුකූලව බඳවා ගැනීම සහ ගෙවනු ලබන පාරිශ්‍රමික සිදු කරනු ලැබේ.

**වයස් සීමාව:**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2016 හි විධිවිධානයන්ට අනුකූලව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**අනෙකුත් ප්‍රතිලාභ:**

- සේවක අර්ථසාදක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය පිලිවෙලින් 12% සහ 3% වනු ඇත. (සේවකයාගේ දායකත්වය 8% කි)

**අයදුම්කිරීමේ ක්‍රමය:**

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීවදත්ත ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද අදාළ සහතික වල පිටපත්ද සමග 2016 ඔක්තෝබර් 31 වන දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙලවරේ "අභ්‍යන්තර විගණක" ලෙස සඳහන් කල යුතුය. කිසිදු හේතුවක් මත අසම්පූර්ණ අයදුම්පත් භාර ගනු නොලැබේ.

**ව්‍යාපෘති කළමණාකරු**
**ව්‍යාපෘති කාර්යාලය - JICA IBSSTER**
**නො.464, දෙවන මහල, බටහිර දිශාව**
**ටී.බී. ජයා මාවත, කොළඹ 10**